# 多言語情報コーナー　　（令和７年　６月号）

## 1. ඔබගේ පහසුව සඳහා කොම්බිනි වෙළඳසැල් මගින් බදු සහතික නිකුත් කිරීමේ සේවාව පිළිබඳ

කොම්බිනි වෙළඳසැල් වල ඇති මල්ටි කොපි යන්ත්‍රය මගින් "ආදායම් සහතික" සහ "පදිංචිය ස්ථිර කිරීමේ සහතිකයට අමතරව අලුතින් බදු සහතිකය සහ බදු ගෙවීමට තිබේද සහ නොතිබේද යන සහතිකද මෙම වෙළඳසැල් මගීන් ලබාගත හැක.මෙම සේවාව භාවිතා කිරීමට ඔබට ඔබේ මයි නම්බර් කාඩ්පත අවශ්‍ය වනු ඇත.

මෙම සේවාවන් ලබාගැනීමේදී කොම්බිනි වෙළඳසැල් මගීන් ලබාගැනීමේ විශේෂත්වය වන්නේ ඔබට ලගම ඇති කොම්බිනි වෙලදසැල් මගින් රාත්‍රී කාලයේදීද  ලබාගැනීමට හැකිවීම වේ.

එසේම, අයදුම්පතක් පිරවීමට අවශ්‍ය නොවන අතර  ඔබ කළ යුත්තේ ඔබ ඉදිරියේ ඇති ස්පර්ශ පැනලය ක්‍රියාත්මක කිරීම පමණක් වන අතර එය ඉතා සරල ක්‍රියාවලියක් වේ.

ඔබගේ පුද්ගලික තොරතුරු ඉතාමත් උසස් ආරක්ෂක පියවරයන් මගින් ආරක්ෂා කර ඇති බවට ඔබට සහතික විය හැකිය.

මෙම සේවාව ලබාගත හැකි කොම්බිනි වෙළඳසැල් වන්නේ සෙවන්-ඉලෙවන්, ලෝසන්, මිනිස්ටොප්, ෆැමිලි මාර්ට් සහ ඉයොන් හි ස්ථාපිත කර ඇති මල්ටි කොපි යන්ත්‍ර මගින් වේ.
සහතික ලබාගැනීමේ කාලය ලෙස උදේ 6:30 සිට රාත්‍රී 11:00 දක්වා වේ.

ඔබ සහතිකය ලබා ගන්නා මූල්‍ය වර්ෂයේ ජනවාරි 1 වන දින තොචිගි නගරයේ ලිපිනයක් තිබිය යුතු අතර, අයදුම් කරන දිනයේදී තොචිගි නගරයේ ලිපිනයක් ද තිබිය යුතුය.

ඔබ බදු ගෙවීමක් සිදු කළ දින සිට එම බදු ගෙවීම සහතිකයේ පිළිබිඹු වන තෙක් සති දෙකක සිට මාසයක් පමණ ගත විය හැකිය. ගෙවීම සිදු කළ වහාම ඔබට  ගෙවූ මුදල සඳහා බදු සහතිකයක් අවශ්‍ය නම්, කරුණාකර ඔබේ රිසිට්පත රැගෙන ඔබේ නගර ශාලාවේ හෝ සාමාන්‍ය ශාඛා කාර්යාලයේ කවුන්ටරයෙන් බදු ගෙවීමේ සතිකය ඉල්ලා සිටිය හැක.

**2. කරුණාකර ඔබගේ My Number කාඩ්පත සඳහා ඉලෙක්ට්‍රොනික සහතිකය යාවත්කාලීන කිරීම පිලිබඳව.**

ඔබගේ My Number කාඩ්පත සඳහා වන විද්‍යුත් සහතිකය ඔබගේ කාඩ්පත නිර්මාණය කිරීමෙන් පසු පස්වන උපන්දිනයේදී කල් ඉකුත් වේ. කල් ඉකුත් වීමේ දිනය ළඟා වූ විට, ඔබට තවදුරටත් ඉලෙක්ට්‍රොනික යෙදුම් හෝ ඔබගේ My Number සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත භාවිතා කිරීමට නොහැකි වනු ඇත.

කල් ඉකුත් වීමේ දිනයට ආසන්න වශයෙන් මාස තුනකට පෙර, "ඉලෙක්ට්‍රොනික සහතික අලුත් කිරීමේ ක්‍රියා පටිපාටිය" රජයෙන් ඔබගේ පදිංචි ස්ථානයට යවනු ලැබේ. කොළ පැහැති මෙම පත්‍රිකාව ලා නිල් පැහැති ලියුම් කවරයක් මගින් ඔබට ලැබෙනු ඇත. කරුණාකර එය පරීක්ෂා කර අවශ්‍ය දෑ සැකසීම සිදුකල හැක. ඔබගේ පදිංචියේ වෙනසක් සිදුවී ඇත්නම් ඔබට දැන්වීම නොලැබීමට හැකියාව ඇත නමුත් කල් ඉකුත් වීමේ දිනයට මාස තුනකට පෙර ඔබට අලුත් කිරීමේ ක්‍රියා පටිපාටිය ආරම්භ කළ හැකිය.

ඔබ ඔබේ කාඩ්පත පුද්ගලිකව අලුත් කරන්නේ නම්, කරුණාකර ඔබගේ My Number කාඩ්පත රැගෙන නගර ශාලාවේ ප්‍රධාන කාර්යාලයේ පුරවැසි ජීවන රටා අංශයට හෝ ඔබේ ඕනෑම ප්‍රාදේශීය ශාඛා කාර්යාලයක ප්‍රජා සංවර්ධන ප්‍රවර්ධන අංශයට පැමිණිය යුතුය.

ඔබට ඔබේ කාඩ්පත නිකුත් කරන විට ඔබ සකසා ඇති PIN අංක දෙකද ඔබට අවශ්‍ය වනු ඇත, එය අංක හතරක් සහ අකුරු හයක් හෝ වැඩි ගණනක් විය යුතුය. ඔබට ඔබේ PIN අංකය අමතක වී ඇත්නම්, ඔබට එය කවුන්ටරයේදී නැවත සැකසිය හැකිය.

## 3. ඔබගේ විශ්‍රාම වැටුප් වාර්තා නැවත පරීක්ෂා කිරීම පිලිබඳව

"විශ්‍රාම වැටුප් නිත්‍ය තැපෑල" ජපන් විශ්‍රාම වැටුප් සේවාව විසින් සෑම වසරකම ජාතික විශ්‍රාම වැටුප් ක්‍රමයට සහ සේවක විශ්‍රාම වැටුප් රක්ෂණ ක්‍රමයට ඇතුළත් වූ අයට යවනු ලබන්නේ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ අවබෝධය ගැඹුරු කිරීමේ අරමුණින් ය.

මෙය බැලීමෙන්, ඔබට ඔබේ විසින් දැනටමත් ගෙවා ඇති විශ්‍රාම වැටුප් මුදල, ඔබේ විශ්‍රාම වැටුප් පද්ධති ලියාපදිංචි කිරීමේ වාර්තාව සහ තවත් දේ පරීක්ෂා කළ හැකිය.

ඔබේ උපන් මාසයට මාස දෙකකට පෙර ඔබේ විශ්‍රාම වැටුප් නිත්‍ය තැපෑල සකස් කරන අතර, සෑම වසරකම ඔබේ උපන් මාසයේ තැපැල් පතක් ඔබට ලැබෙනු ඇත.

ඊට අමතරව, විශ්‍රාම වැටුප් නිත්‍ය තැපෑලෙහි ලියුම් සිහිකැඳවීමක් වයස අවුරුදු 35, 45 සහ 59 සන්ධිස්ථාන වයස්වලදී තැපෑලෙන් යවනු ලැබේ.

ඔබට ඔබේ විශ්‍රාම වැටුප් නිත්‍ය තැපෑල ලැබුණු විට, ලැයිස්තුගත කර ඇති විශ්‍රාම වැටුප් ලියාපදිංචි කිරීමේ වාර්තාව පරීක්ෂා කිරීමට වග බලා ගන්න.

ඔබේ විශ්‍රාම වැටුප් ලියාපදිංචි කිරීමේ වාර්තාවේ දෝෂයක් හෝ අතපසුවීමක් සිදුවී ඇති බවට ඔබ කනස්සල්ලට පත්ව සිටී නම්, කරුණාකර විශ්‍රාම වැටුප් නිත්‍ය තැපෑල විශේෂිත දුරකථන අංකය වන 0570-058-555 සමඟ පරීක්ෂා කරන්න